කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

## ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය
## GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි.
Issued by Forecasting Division, National Meteorological Centre.

### 2020 මැයි මස 20 දින සඳහා කාලගුණ අනාවැකිය

**2020 මැයි මස 20 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.**

බටහිර-මධ්‍යම බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පැවති අතිප්‍රචණ්ඩ සුළි කුණාටුව ("අම්ෆන්") මේ වනවිට ඉතා ප්‍රචණ්ඩ සුළි කුණාටුවක් බවට පත් වී, 19 වන දින ප.ව. 11.30 වන විට ත්‍රිකුණාමලය සිට කි.මී 1250 පමණ ඊසාන දෙසින් උතුරු අක්ෂාංශ 18.4 ත් නැගෙනහිර දේශාංශ 87.1 ත් ආසන්නව වයඹ සහ බටහිර-මධ්‍යම බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය ආශ්‍රිතව ස්ථානගතව පැවතුනි. මෙම පද්ධතිය තවදුරටත් උතුරට බරව ඊසාන දෙසට දිවයිනෙන් ඉවතට ගමන් කරන අතර අද (20) දින අපරභාගය වන විට බටහිර බෙංගාල වෙරළ හරහා ගමන් කරනු ඇතැයි බලාපොරොත්තුවේ.

එහි බලපෑම හේතුවෙන් දිවයිනේ, දකුණ, බස්නාහිර, සබරගමුව, මධ්‍යම සහ වයඹ පළාත් වල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. මධ්‍යම කඳුකරයේ බටහිර බෑවුම් ප්‍රදේශවලට, විශේෂයෙන් නුවරඑළිය, කළුතර, රත්නපුර, කෑගල්ල, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවල ඇතැම් ස්ථාන වලට මි.මී. 100 පමණ තද වැසිද ඇති විය හැක.

දිවයින හරහා සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (40-50) දක්වා වැඩි විය හැක.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට අකුණු මගින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

### WEATHER FORECAST FOR 20 MAY 2020

**Issued at 05.30 a.m. on 20 May 2020**

**The Super Cyclonic storm "AMPHAN" lay centered as an Extremely Severe Cyclonic storm over west-central Bay of Bengal and neighborhood, at 11.30 p.m. on 19th May near latitude 18.4°N and longitude 87.1°E, about 1250 km North-east of Trincomalee. It is very likely to move further north-northeastwards away from the island across west Bengal coast during the afternoon today (20th May).**

**Due to the influence of the system, Showers or thundershowers will occur at several places in Southern, Western, Sabaragamuwa, Central and North-western provinces. Heavy showers about 100 mm in the western slope of central hills, particularly in Nuwara-Eliya, Kaluthara, Ratnapura, Kegalle, Galle and Matara districts.**

**Wind speed can increase up to (40-50) kmph at times over the island.**

**General public is kindly requested to take adequate precautions to minimize damages caused by lightning activity during thundershowers.**

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

දිවයින වටා මුහුදේ කාලගුණය සහ ස්වභාවය

# WEATHER AND STATE OF SEA AROUND THE ISLAND

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි

Issued by Forecasting Division, National Meteorological Centre

## ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය

**2020 මැයි මස 20 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.**

බටහිර-මධ්‍යම බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පැවති අතිප්‍රචණ්ඩ සුළි කුණාටුව ("අම්ෆන්") මේ වනවිට ඉතා ප්‍රචණ්ඩ සුළි කුණාටුවක් බවට පත් වී, 19 වන දින ප.ව. 11.30 වන විට ත්‍රිකුණාමලය සිට කි.මී 1250 පමණ ඊසාන දෙසින් උතුරු අක්ෂාංශ 18.4 ත් නැගෙනහිර දේශාංශ 87.1 ත් ආසන්නව වයඹ සහ බටහිර-මධ්‍යම බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය ආශ්‍රිතව ස්ථානගතව පැවතුනි. මෙම පද්ධතිය තවදුරටත් උතුරට බරව ඊසාන දෙසට දිවයිනෙන් ඉවතට ගමන් කරන අතර අද (20) දින අපරභාගය වන විට බටහිර බෙංගාල වෙරළ හරහා ගමන් කරනු ඇතැයි බලාපොරොත්තුවේ.

ධීවර හා නාවුක කටයුතු වල යෙදෙන්නන් මේ සම්බන්දයෙන් නිකුත් කරන ඉදිරි නිවේදන පිලිබඳ අවධානයෙන් කටයුතු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

**වැසි තත්ත්වය:**

මන්නාරම සිට පුත්තලම, කොළඹ, ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

**සුළඟ:**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං නිරිත දෙසින් හමයි. සුළගේ වේගය පැ.කි.මී. (45-55) පමණ වේ. මන්නාරම සිට පුත්තලම, කොළඹ, ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (70-80) දක්වා වැඩි විය හැක.

**මුහුදේ ස්වභාවය:**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශ රළු විය හැකි අතර පුත්තලම සිට ගාල්ල, හම්බන්තොට සහ පොතුවිල් හරහා ත්‍රිකුණාමලය දක්වා වන මුහුදු ප්‍රදේශ විටින් විට ඉතා රළු වේ.
ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල (පැ.කි.මී. 70-80 දක්වා) තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.

ධීවර සහ නාවුක ප්‍රජාව මේ පිලිබඳව අවධානයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS
## Issued at 05.30 a.m. on 20 May 2020

The Super Cyclonic storm "AMPHAN" lay centered as an Extremely Severe Cyclonic storm over west-central Bay of Bengal and neighborhood, at 11.30 p.m. on 19th May near latitude 18.4°N and longitude 87.1°E, about 1250 km North-east of Trincomalee. It is very likely to move further north-northeastwards away from the island across west Bengal coast during the afternoon today (20th May).

**Fishing and naval community are requested to be attentive regarding future forecasts issued in this regard.**

### Condition of Rain:

Showers or thundershowers will occur at several places in the sea areas extending from Mannar to Pottuvil via Puttalam, Colombo, Galle and Hambantota.

### Winds:

Winds will be South-westerly in the sea area around the island. Wind speed will be **(45-55) kmph**. Wind speed can increase up to **(70-80) kmph** at times in the sea area extending from Mannar to Pottuvil via Puttalam, Colombo, Galle and Hambantota.

### State of Sea:

The sea areas around the island can be rough and the sea area extending from Puttalam to Trincomalee via Colombo, Galle, Hambantota and Potuvil will be very rough at times.

**Temporarily strong gusty winds (up to 70-80 kmph) and very rough seas can be expected during thundershowers.**

**Naval and fishing communities are requested to be vigilant in this regards.**

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි